# 01.සතර කන්මන්ත්‍රණය

1. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වෛදේහ රාජ්‍ය ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න.

පිළිතුරට අවශ්‍ය වන්නේ,

මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය හා ඒ තුළින් වෛදේහ රාජ්‍ය ආරක්ෂා වීම නිදසුන් මගින් සනාථ කිරීමයි.

❖ පළමු නිදසුන

- සාර්ථක චර පුරුෂ සේවාවක් ක්‍රියාත්මක කිරීම තුළින් වෛදේහ රාජ්‍ය ආරක්ෂා වීම.

ගිරා පණ්ඩිතයන් චූලනී බ්‍රහ්ම දත්ත රජුගේ මඟුල් උයනට ගොස් ඔත්තු බැලීම

''ගිරා පණ්ඩිතයෝ මේ ක්‍රියාව දැක, 'මේ එක් කාරණයක් වුව මැනැව. අද පණ්ඩිතයන් වහන්සේට කිය යුතු කිසිවක් අසමි' යි උයනට වැද, මඟුල් සල් ගස කොළ අතර සැඟවී හුන්හ.''

❖ දෙවන නිදසුන

- තැනට සුදුසු නුවණ යෙදීම නිසා වෛදේහ රාජ්‍ය ආරක්ෂා වීම.

නුවර වැසියන්ගේ ස්ථානවල වෙනසක් සිදු කිරීම. දිළිඳුන් පිටට යවා ධනවතුන් නුවර තුළට ගෙන්වීම. ධන ධාන්‍ය ආදිය ආරක්ෂා කිරීම. දූරදර්ශී පිළිවෙතක් අනුගමනය කිරීම.

''දැන් ඔහු කළ මන්ත්‍රණය මුදුන් පැමිණ නො දෙමි, යි සිතා, ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත් කරවා පිටි නුවර ලැවූ සේක.''

❖ තෙවන නිදසුන

❖

- චූලනි බ්‍රහ්මදත්ත රජුගේ හා කේවට්ටගේ සියලු උපක්‍රමයන් අසාර්ථක කිරීමට උත්සුක වීම. ඒ නිසා වෛදේහ රාජධානිය ආරක්ෂා වීම.

වෛදේහ නුවර තුළට ජලය අහිමි කළ අවස්ථාවේ දී සියුම් උපක්‍රමයකින් ජලය බොහෝ සේ ඇති බව හැඟවීට උපක්‍රමයක් යෙදීම.

''මාගේ ස්වාමි දරු වූ බෝධිසත්ත්වයන් වහන්සේ ඒ මල් දඬු මුලින් උදුරුවා ''මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවනට දෙව''යි තමන් වහන්සේගේ පුරුෂයන්ට දුන්හ.''